**ටෙන්ඩර් දැන්වීමයි**
**දොම්පෙ ප්‍රාදේශීය සභාව - කිරිදිවැල**

දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි පහත උපලේඛනයේ සදහන් සතිපොල, මස්කඩ, මාළුකඩ තොටුපොළ සහ අනිකුත් දේපල 2025.01.01 දින සිට 2025.12.31 දක්වා වූ කාල සීමාවට වෙළද අයිතිය බදුදීම පිණිස සීල් තැබූ ටෙන්ඩර්පත් 2024.11.12 වන දින පෙ.ව.10.00 දක්වා මා විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර්පත් භාරගැනීමේ වේලාව අවසන් වූ වහාම ටෙන්ඩර්පත් විවෘත කිරීම කිරිදිවැල පිහිටි දොම්පෙ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ ශ්‍රවණාගාරයේදී සිදු කෙරේ. එම අවස්ථාවට සහභාගි වීමට ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ ලිඛිත බලයලත් නියෝජිතයෙකුට අවසර දෙනු ලැබේ.

| අ.අ. | ස්ථානය | අවම ලංසුව 2025 | ටෙන්ඩර් ඇප මුදල | පෝරම ගාස්තු |
|---|---|---|---|---|
| | වැකේ උප කාර්යාලය | | | |
| 1. | කිරිදිවැල සතිපොළ සහ පලතුරු පොල | 15000000/- | 1250000/- | 2000/- |
| 2. | කිරිදිවැල එළ හරක් මස් කඩය | 1000000/- | 83350/- | 2000/- |
| 3. | කිරිදිවැල ඌරු මස් කඩය | 1100000/- | 91700/- | 2000/- |
| 4. | කිරිදිවැල කුකුල් මස් කඩය | 1100000/- | 91700/- | 2000/- |
| 5. | කිරිදිවැල පොදු වැසිකිළිය | 196000/- | 16350/- | 2000/- |
| 6. | කිරිදිවැල රථ ගාල | 335000/- | 27920/- | 2000/- |
| 7. | සති පොල භූමියේ පිහිටි හෙළ බොජුන් හල | 273000/- | 22750/- | 2000/- |
| 8. | මාලිගාවත්ත ග්‍රෑන්ඩ් සෙන්චරි හෝටලය අසල ඉඩම පොදු කොටස | 11000/- | 920/- | 200/- |
| 9. | මාලිගාවත්ත W.D රූපසිංහ වෙන්දේසි ඉඩමේ පොදු කොටස. | 27500/- | 2300/- | 200/- |
| 10. | වතුරුගම මයිලෑන්ඩ් වෙන්දේසි ඉඩම පොදු කොටස | 5500/- | 460/- | 200/- |
| 11. | උපාලි ගුණරත්න ක්‍රිඩාංගනයට මායිම්ව පිහිටි ඉඩම | 2200/- | 200/- | 200/- |
| | පූගොඩ උප කාර්යාලය | | | |
| 1. | පූගොඩ සතිපොළ | 700000/- | 58350/- | 2000/- |
| 2 | පූගොඩ එළ හරක් මස් කඩය | 1000000/- | 83350/- | 2000/- |
| 3. | පූගොඩ ඌරු මස් කඩය | 691000/- | 57600/- | 2000/- |
| 4. | පූගොඩ කුකුල් මස් කඩය | 422000/- | 35200/- | 2000/- |
| 5. | පූගොඩ පොදු වැසිකිළිය | 96000/- | 8000/- | 1000/- |
| 6. | පූගොඩ මාළු කඩය | 845000/- | 70420/- | 2000/- |
| 7. | ඉසිඹු වදුල | 20900/- | 1750/- | 2000/- |
| 8. | කපුගොඩ තොටුපළ | 86000/- | 7200/- | 1000/- |
| 9. | තිත්තපත්තර පාසල ඉදිරිපිට ඉඩම් කොටස | 66000/- | 550/- | 200/- |
| | දොම්පෙ උප කාර්යාලය | | | |
| 1. | දොම්පෙ සෙනසුරාදා සති පොළ | 1349000/- | 112420/- | 2000/- |
| 2 | දෙකටන අගහරුවාදා සති පොළ | 810000/- | 67500/- | 2000/- |
| 3. | උඩමාපිටිගම කපාපු තොටුපල | 59000/- | 4950/- | 1000/- |
| 4. | කදුබොඩ කුඩුමිරිසවත්ත පොදු ඉඩම | 4400/- | 400/- | 200/- |

| | | | | |
|---|---|---|---|---|
| 5. | කදුබොඩ එස්ට්‍රේට් පොදු ඉඩම | 4400/- | 400/- | 200/- |
| 6. | පහළ මාපිටිගම දර්ශණීය වත්ත පොදු ඉඩම (අරලිය ලෑන්ඩ් ආයතනය වෙන්දේසි කල ඉඩමේ පොදු කොටස හැර ඉතිරි කොටස) | 11000/- | 950/- | 200/- |
| 7. | පාළුගම සමගි උයන පොදු ඉඩම | 5500/- | 460/- | 200/- |
| 8. | පහළ මාපිටිගම දර්ශණීය වත්ත පොදු ඉඩම 11 | 5500/- | 460/- | 200/- |
| | **කෑරගල උප කාර්යාලය** | | | |
| 1. | කෑරගල සතිපොළ | 196000/- | 16350/- | 2000/- |
| 2 | පැලහැල මංචනායකවත්ත මාබිම මූකලාන පොදු ඉඩම(යශෝධා පුද්ගලික සමාගම අසල) | 8000 | 700/- | 200/- |
| 3 | පැලහැල මාබිම මූකලාන පොදු ඉඩම(1 වන පටුමග රාගම පොල්වත්ත) | 5000 | 450/- | 200/- |
| 4 | පැලහැල මාබිම මූකලාන පොදු ඉඩම(ගාඩියන් ලෑන්ඩ් පොදු ඉඩම) | 4500 | 375/- | 200/- |
| 5 | පැලහැල මාබිම මූකලාන පොදු ඉඩම(අනුර දේපල සමාගම පොදු ඉඩම) | 8800 | 750/- | 200/- |
| 6. | ලුණුගම මිල්ලගහවත්ත පැපොල්ගහදෙණිය පොදු ඉඩම(වැලිකල මහතාගේ නිවස ඉදිරිපිට) | 6500 | 550/- | 200/- |
| 7. | ලුණුගම වෙරළුගහවත්ත පොදු ඉඩම(පැරණි සමුපකාරය අසල) | 5500 | 460/- | 200/- |
| 8. | ලුණුගම මිල්ලගහවත්ත පැපොල්ගහදෙණිය පොදු ඉඩම(බුන්වල පාර ඉදිරිපිට) | 5500 | 460/- | 200/- |
| 9. | මාහේන ද ෆිනෑන්ස් පොදු ඉඩම | 4500 | 375/- | 200/- |
| 10. | නුගගහලන්ද පාර වෙන්දේසි ඉඩම(අනුර දේපල බණ්ඩාරවත්ත) | 4500 | 375/- | 200/- |
| 11. | මණ්ඩාවල ඉඹුල්ගස්ලන්ද පොදු ඉඩම | 4000 | 350/- | 200/- |
| 12 | ලුණුගම ගොඩපරගහවත්ත පොදු ඉඩම(පූගොඩ ඩබ්.පී.රූපසිංහ) | 7700 | 650/- | 200/- |

<u>ටෙන්ඩර් කොන්දේසි</u>

1. ඉහත උපලේඛනයේ විස්තර කර ඇති පරිදි නියමිත ඇප මුදල්,ටෙන්ඩර් පෝරම ගාස්තු හා බදු මුදල් මුදලින් ගෙවා මෙම කාර්යාලයෙන් ලබා ගන්නා අකෘතිපත් මගින් පමණක් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මේ සඳහා චෙක්පත් භාර ගනු නොලැබේ.

2. ටෙන්ඩර් පෝරම නිකුත් කිරීම 2024.11.11 වන දින ප.ව. 2.30 දක්වා සිදු කෙරේ.

3. පහත සඳහන් පරිදි ටෙන්ඩර් පෝරම හා ටෙන්ඩර් කොන්දේසි ලබා ගැනීම සඳහා ආදායම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු අතර එසේ ඉදිරිපත් නොකරන අයට ටෙන්ඩර් පෝරම නිකුත් කරනු නොලැබේ.

| | |
|---|---|
| ලක්ෂ 02-05 දක්වා | ලක්ෂ 01 ක ආදායම් සහතිකයක් |
| ලක්ෂ 05-10 දක්වා | ලක්ෂ 02 ක ආදායම් සහතිකයක් |
| ලක්ෂ 10-15 දක්වා | ලක්ෂ 03 ක ආදායම් සහතිකයක් |
| ලක්ෂ 15-20 දක්වා | ලක්ෂ 04 ක ආදායම් සහතිකයක් |
| ලක්ෂ 20 ට වැඩි | ලක්ෂ 05 ක ආදායම් සහතිකයක් |

4. ටෙන්ඩර් පෝරම හා ටෙන්ඩර් කොන්දේසි වල මුල් පිටපත හා අනු පිටපත වෙන වෙනම කවරවල බහා එම කවරවල මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර එකම කවරයක බහා එම කවරය සීල් තබා ඉදිරිපත් කළ යුතුය.

5. ටෙන්ඩර් ඉල්ලුම්කරුවන් ටෙන්ඩර් පෝරම හා ටෙන්ඩර් කොන්දේසි ලබා ගැනීමේදී අනිවාර්යෙන්ම ජාතික හැඳුනුම්පත ,රියදුරු බලපත්‍රය හෝ විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුය.

6. **ලේකම් , දොම්පෙ ප්‍රාදේශීය සභාව , කිරිඳිවැල** ලිපිනයට නියමිත දින නියමිත වෙලාවට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.ටෙන්ඩර් බහාලන කවරයේ වම් පස ඉහළ කෙලවරේ තමන් ඉල්ලුම් කරන ටෙන්ඩරය පැහැදිළිව සඳහන් කළ යුතුය.

7. ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර් ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. අවම ලංසුවට අඩුවෙන් ඉල්ලුම් කරන ලද ටෙන්ඩර් කරුවන්ගේ හා ටෙන්ඩර් පෝරම ලබා ගෙන ටෙන්ඩර් ඉදිරිපත් නොකරන ටෙන්ඩර් කරුවන්ගේ ඇප මුදල් ආපසු ගෙවනු නොලැබේ.

9. සාර්ථක ටෙන්ඩර්කරුවන් වෙත ටෙන්ඩරය පිළිගත් බව දැනම් දීමෙන් පසු දින 7 ක් ඇතුළත මුළු ටෙන්ඩර් මුදල හා බදු මුදල එකවර ගෙවීමට අවසර දෙනු ලැබේ.එසේ නොමැති නම් වාර්ෂික ටෙන්ඩර් මුදලින් මාස 5 ක මුදලක් හා රජය විසින් පනවා ඇති බදු මුදල් එකවර තැන්පත් කර ඉතිරි මුදල් 2024 වර්ෂයේ ජනවාරි මස සිට සෑම මසකම 10 වෙනි දිනට ප්‍රථම ගෙවන බවට ප්‍රාදේශීය සභාව සමඟ ගිවිසුමකට එළඹිය යුතුයි. මාස 05 ක තැන්පත් මුදල් වර්ෂයේ අවසාන මාස 05 ට හිලව් කරන අතර මාසික ගාස්තු ගෙවීම 10 වෙනි දින පසු වුවහත් 10% ක දඩ මුදලක් අය කරනු ලැබේ.

10. ටෙන්ඩරය පිළිගත් බව දැනුම් දුන් පසු මුල් ඉල්ලුම්කරු විසින් එම ටෙන්ඩරය ප්‍රතික්ෂේප කළ හොත් ටෙන්ඩර් ඇප මුදල සභාව සතු කරන අතර දෙවන ඉල්ලුම්කරු පළමු ඉල්ලුම්කරුගේ මුදලට ටෙන්ඩරය බාර ගැනීමට එකඟතාව විමසා ඒ මුදලට හෝ දෙවන ටෙන්ඩර් කරුගේ ඉල්ලුම් මුදලට ලබා දෙන අයුරින් කටයුතු කරනු ලැබේ.

11. පිළිගත් ටෙන්ඩර් කරු විසින් ටෙන්ඩර් ඉල්ලුම් මුදල අනුව මාසික බදු මුදල ගෙවිය යුතු අතර රජය විසින් වරින්වර පනවන ලද බදු ගාස්තු සභාවට ගෙවිය යුතුය.

12. ටෙන්ඩර් කරු විසින් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර්පත් අතුරින් කිසිම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් කිසිදු හේතුවක් නොදන්වා පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය සභාව සතුය.

13. පසුගිය වසර වල ටෙන්ඩර් සම්බන්ධයෙන් අසාධු ලේඛනයට ඇතුළත්ව ඇති හෝ පවතින වර්ෂයේ ටෙන්ඩර් හිඟ මුදල් තබා ඇති අයවලුන්ට ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ නොහැකිය.

14. ටෙන්ඩර් ලියවිලි වෙනස් කිරීමක් හෝ මකා දැමීමක් කළේ නම් ඒ සියළුම තැන් වල පිටපත් දෙකෙහිම කෙටි අත්සන යෙදිය යුතුය.

15. ටෙන්ඩර් ලබා දෙන සියලුම ගොඩනැගිලි වල සභාව මගින් ජලය, විදුලිය සපයා ඇති අවස්ථා වල ජලය, විදුලි බිල්පත් බදු ගැනුම්කරු විසින් ගෙවිය යුතු අතර ජලය, විදුලිය සපයා ඇති සති පොළ , මස් කඩ , මාළු කඩ , පොදු වැසිකිළි සහ වෙනත් ගොඩනැගිලි සඳහා ටෙන්ඩර් කරු විසින් රු.25000/- ක මුදලක් ප්‍රාදේශීය සභාවේ තැන්පත් කළ යුතුය.

16. සති පොළ බදු ලබා ගන්නා ලද බදු කරුවන් ලේකම් / කාර්යභාර නිලධාරි / සෞඛ්‍ය පරිපාලකගේ උපදෙස් අනුව පොළ භූමියේ කැලි කසළ බැහැර කිරීම හා කාණු පද්ධති පවිත්‍ර කිරීම කළ යුතුය.දෙනු ලබන උපදෙස් අනුව කටයුතු කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩරය අවලංගු කර නැවත ටෙන්ඩර් කිරීමට කටයුතු කරනු ලැබේ.

17. සති පොළ භූමියට ඇතුල් වෙන මාර්ගයේ සහ වෙළඳපොළ දර්ශනයට හානියක් වන අයුරින් තාවකාලික ඉදිකිරීම් කිරීමට වෙළඳුන්ට ඉඩදීම බදුකරුවන් විසින් නොකළ යුතුය. එසේ යම් ඉදිකිරීමක් සිදුකළහොත් එම ඉදිකිරීම කිසිදු දැනුම්දීමකින් තොරව ඉවත්කිරීමට සභාව කටයුතු කරනු ඇත.

18. සතිපොළ වෙළඳුන්ගෙන් සාධාරණ හා යුක්ති සහගත ගාස්තුවක් බදු ගැනුම්කරු විසින් අය කළ යුතු අතර එසේ අය කර ගනු ලබන ගාස්තුව බදු දීමනාකරු වන ප්‍රාදේශීය සභාවේ ලිඛිත අවසරයක් නොමැතිව වැඩි කිරීම නොකළ යුතුය.

19. පොදු ඉඩම් බදු ලබා ගන්නා ටෙන්ඩර් කරුවන් විසින් තාවකාලික භෝග පමණක් වගා කළ යුතු අතර ඉදිරිපත් කරන බදු මුදල එකවර සභාවේ තැන්පත් කළ යුතුය.

**සැලකිය යුතුය - බදු ලබා ගන්නා ඉඩම් වල අන්නාසි , කෙසෙල් වැනි බෝග වගා කිරීම නොකළ යුතුය.**

දොම්පෙ ප්‍රාදේශීය සභාව
ප්‍රධාන කාර්යාලය,
කිරිඳිවැල.
2024.10.22